# මලාලා මගෙ දෝණියේ...



සොඳුරු ලෝකය අඳුරු කරනා
සත්වගට මළ පුඩුව සදනා
මනුෂ්‍යත්වෙට නිගා දෙවනා
ත්‍රස්තවාදය අභිමුවේ
කෙලින් හිටගත් මිනිස් දියණී
මලාලා මගෙ දෝණියේ...

ලොවේ හිරු ආලෝකෙ බිඳිනා
දණන් හට අසහනය ගෙනෙනා
මහා වියසන උරුම කරනා
ත්‍රස්තවාදය අභිමුවේ
කෙලින් හිටගත් මිනිස් දියණී
මලාලා මගෙ දෝණියේ...

ලොවක දරු පරපුරක උරුමය
නසාලන්නට මාන ඇල්ලූ
මිනිස් වෙස්ගත් තිරිසනුන් රැළ
නුඹේ අභියස ගල් වුනා
සූර්ය දෙවි රාජයා හමුවේ
කදෝ පැණි එළි පරිද්දෙන්
ත්‍රස්තවාදී මහා වියරුව
හීන් කෙඳිරිල්ලක් වුනා

ලොවේ විද්වත් සමුළු මණ්ඩප
සිසාරා නැගි දයාවේ හඬ
ඉන්දු ගංගා නිම්නයේ පිපි
සුවඳ විහිදූ කුසුම නුඹමයි
මලාලා මගෙ දෝණියේ...

- සුනිල් උඩුකල -

